සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Christianity
## ක්‍රිස්තියානි ධර්මය

Name :- ................................................... Grade : -................ Index number:-....................

### I කොටස

❖ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. බයිබල් අම්මාරියක ලෙස විරුදාවලිය ලැබුවේ
   (i) ජොයිස් ද සිල්වා ය (ii) මරියා ය
   (iii) එලිෂා ඇග්නිව් ය (iv) මාර්තාය

2. කාන්තා ශ්‍රාවකත්වය ලබා ගැනීමේ දී කාන්තාවන්ට ගෙනදුන් අභියෝගයකි.
   (i) දේව සේවය කිරීමේ අයිතිය සැමට හිමි නොවන බව
   (ii) ප්‍රමුඛත්වය ලෞකික කාරණා සඳහා නොවන බව
   (iii) ස්ත්‍රී පුරුෂ භේදයක් නොවන බව
   (iv) කාලය වඩා වැදගත් විය යුතු බව

3. ජේසුස්වහන්සේ නාදුනන බව කී ගෝලයා
   (i) යාකොබ්ය (ii) යොහාන්ය (iii) පේදුරුය (iv) මතෙව්ය

4. ශුද්ධාත්ම දීමනාවක් නොවන්නේ,
   (i) හාස්කම් කිරීම (ii) ආත්ම විමසීම
   (iii) සෙනඟ භේද කරවීම (iv) අන් භාෂා කථා කිරීම.

5. ඉවසීම නැමැති ශුද්ධාත්ම ඵලයෙන් අදහස් කරන්නේ,
   (i) දයානුකම්පාවයි (ii) විනය හා සංයමයයි
   (iii) දරා ගැනීමයි (iv) නපුර පිටු දැකීමයි

6. ඉව්ලින්කානි යුද්ධයෙන් පීඩා විඳි අය වෙනුවෙන් සෑදූ රෝහල් නම් කළේ,
   (i) ප්‍රීති නිවස ලෙසය (ii) සන්ධ්‍යා නිවස ලෙසය
   (iii) සාමයේ නිවස ලෙසය (iv) නංගී ගෙදර ලෙසය

7. ගෝලයන්ට ''ඔරුවේ දකුණු පැත්තෙන් දැල හෙලන්නයි'' කීමෙන් ජේසුස්වහන්සේ අදහස් කලේ,
   (i) බියට පත් වූ ගෝලයන් ධෛර්යමත් කිරීමටය.
   (ii) නැවත ධීවර කර්මාන්තයේ යෙදීම සඳහා දිරි දීමටය.
   (iii) ජේසුස්වහන්සේ සමඟ පෙර තිබූ සබඳතාව සිහිපත් කරදීමට
   (iv) මාළු අල්ලා ගැනීම සඳහා මඟපෙන්වීමට

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. යහපත් එඬේරෙකුගේ භූමිකාව දැරූ දේවදාසයා වන්නේ,
   (i) සෝමසිරි කුමරදාස් පෙරේරා දේවගැතිතුමාය
   (ii) ඩොනල්ඩ් කනගරත්නම් අනුනායකතුමාය.
   (iii) ඉව්ලින්කාන්ති තුමියය
   (iv) ඇන්ඩෲ කුමාරගේ හිමිපාණෝය

9. පාසැලේ දී අන් අයගේ ජීවිත ගොඩ නැගීම උදෙසා නොකල යුතු දෙයකි.
   (i) යහපත් ජීවිතයක් ගත කිරීම.
   (ii) එකට එක කිරීමෙන් පලිගැනීම.
   (iii) ගැටලු හා ප්‍රශ්න හමුවේ නිවැරදිව ක්‍රියා කිරීම.
   (iv) සුහද සබඳතා වර්ධනය කර ගැනීම.

10. යුදෙව් සමාජයේ පිලිගැනීමට ලක් වූ පිරිසකි.
   (i) දිළින්දෝ (ii) පූජකවරු (iii) අයකැමියෝ (iv) එඬේරු

11. පව්කරුවන් සම්බන්ධයෙන් අප ක්‍රියා කල යුත්තේ,
   (i) ඔවුන් සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීමෙනි.
   (ii) ඔවුන්ගේ ඇසුර නවතා දැමීමෙනි.
   (iii) ගැලවීමේ පණිවුඩය බෙදා ගැනීමෙනි.
   (iv) ඔවුන් නීතිය ඉදිරියට ගෙන ගොස් දඬුවම් දීමෙනි.

12. අපගේ ජීවිත ගැටලු හමුවේ ක්‍රියා කළ යුත්තේ,
   (i) මිත්‍යා විශ්වාස මත සහනය සෙවීම. (ii) සියලු බලාපොරොත්තු අතහැර දැමීම.
   (iii) ස්වාමින්වහන්සේ තුළ විශ්වාස කිරීම. (iv) වේදනාවෙන් දිවි ගෙවීම.

13. බයිබලයට අනුව මාර්තා
   (i) ජේසුස්වහන්සේගේ පාමුල සිටිමට ප්‍රිය කලා ය.
   (ii) දේව වචනය ඇසීමට යොමු වූවාය.
   (iii) යහපත අවබෝධ කර ගත්තාය.
   (iv) ආගන්තුක සත්කාරයට මුල්තැන දුන්නාය.

14. තම මැවිල්ල තුළ දෙවි සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයාට අසමසම ස්ථානයක් හිමිකර දුන්නේ,
   (i) සියලු සතුන්ට අධිපති වීමටය.
   (ii) ගස්වැල් වල එල ප්‍රයෝජනයට ගැනීමටය.
   (iii) පොළොව මත සිය වර්ගයා බෝ කිරීමටය.
   (iv) අප කෙරෙහි දැක් වූ අසීමිත ප්‍රේමය නිසාය.

15. ලෝකය මැවීමේ දී දෙවියන් වහන්සේ මනුෂ්‍යයා වෙත හිමි දුන් වරප්‍රසාදයකි.
   (i) සිතැඟි වලට වහල්ව ක්‍රියා කිරීම.
   (ii) ලෞකික දේට සිත යොමු කිරීම.
   (iii) දේව අණට පිටුපෑම.
   (iv) හොඳ නරක තෝරා ගැනීමේ නිදහස

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

16. ඊශ්‍රායෙල්වරු මිසරයේ පාරාවෝ රජු යටතේ වහලුන්ව සිටි කාල සීමාව
    (i) අවුඃ 200යකි (ii) අවුඃ 430 කි. (iii) අවු. 350කි. (iv) අවු. 520කි.

17. ප්‍රශ්න කරදර තුළින් ගමන් කිරීමේ දී අප විසින් කල යුත්තේ
    (i) අවලාද නැගීමය (ii) ඇදහිල්ලෙන් සිටීමය.
    (iii) මැසිවිලි නැගීමය (iv) බලාපොරොත්තු අත්හැර දැමීමය.

18. යහපත් බැටළු එඬේරෙකුගේ ලක්ෂණයක් නොවේ.
    (i) තම රැළ පෝෂණය කිරීම. (ii) තම රැළට රැකවරණය සැලසීම.
    (iii) අනතුරක් දුටු විට පලා යාම. (iv) නැති වූ බැටළුවන් සොයා යාම.

19. දේව කැඳවීම ලබාගන්නා කෙනෙකුගේ අයහපත් ලක්ෂණයකි.
    (i) පසුතැවිලිවීම. (ii) නොවටිනා බව අවබෝධ කර ගැනීම.
    (iii) ලෝකට ඇළුම් වීම. (iv) සියල්ල අත් හැරීම.

20. පන්දහසකට කෑම දීමේ දී අපට හමුවන ප්‍රේරිතයා
    (i) මතෙව්ය (ii) සීමොන්ය (iii) පිලිප්ය (iv) යාකොබ්ය

(2 × 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1. (i) ජුදෙව් සමාජයේ සිටි කාන්තාවන්ට ජේසුස්වහන්සේ අනුකම්පා කල අවස්ථා 2ක් ලියන්න.
   (ii) ''ස්වාමීනි, මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි'' මෙසේ පැවසුවේ කවුරු විසින් කා හටද?
   (iii) කිතුනු අප තුළ තිබිය යුතු ශුද්ධාත්ම ඵල 2ක් ලියන්න.
   (iv) මැවීම ගැන සඳහන් වන බයිබලීය පොත කුමක්ද?
   (v) ඊශ්‍රායෙල් ජනතාවට මිසර පාලකවරු පීඩා කිරීමට හේතුව කුමක්ද?
   (vi) බැටළු එඬේරා ගැන සඳහන් වන බයිබල් පොත කුමක්ද?
   (vii) ''දේව කැඳවීම'' යනු කුමක්ද? පැහැදිලි කරන්න.
   (viii) ජේසුස්වහන්සේ ගෝලයන් කැඳවූයේ කොහේදී ද?
   (ix) ජේසුස්වහන්සේ මුළු රැයක් පුරා යාච්ඤා කරමින් කලේ කුමක්ද?
   (x) එඬේර භූමිකාව දැර දෙදෙනෙක් නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

2. ''යන්න තවත් පව් නොකරන්න''
   (i) මෙසේ පැවසූවේ කා හටද? (ලකුණු 2)
   (ii) ''ඔබ අතරින් පවක් නැති තැනැත්තා පළමු කොට ඇයට ගලක් ගසන්න'' මෙම වදනින් අපට අවබෝධ වන්නේ කුමක්ද? (ලකුණු 3)
   (iii) සමාජයෙන් කොන් වූ පිරිස් කීපයක් නම් කරන්න. ඒ අය ගැන කිතුනු අප ක්‍රියා කල යුත්තේ කෙසේද? (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

3. ''දේව ස්වරූපය අනුව මනුෂ්‍යයා මවනු ලැබූ සේක''

(i) මැවිල්ලේ භාරකරු වූයේ කවුරුන්ද? (ලකුණු 2)

(ii) මිනිසා විසින් දේව මැවිල්ලට සිදු කරන හානි 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) දේව මැවිල්ල ආරක්ෂා කර ගැනීමට අප ක්‍රියා කල යුත්තේ කෙසේද? (ලකුණු 5)

4. ඊශ්‍රායෙල් සෙනඟ වහල්කමෙන් මිදී ඒම

(i) ඊශ්‍රායෙල් සෙනඟ වහල්කමෙන් මුදා ගැනිමට දෙවියන්වහන්සේ පත් කලේ කාවද? (ලකුණු 2)

(ii) දේවපියා ඊශ්‍රායෙල් සෙනඟට රැකවරණය දුන් අවස්ථා 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) දේවපියාගෙන් කිතුනු අප රැකවරණය ලබන අවස්ථා 5ක් ලියන්න. (ලකුණු 5)

5. දියඹට ගොස් දැල් හෙලන්න

(i) ජේසුස්වහන්සේ මෙසේ පැවසුවේ කා හටද? (ලකුණු 2)

(ii) උන්වහන්සේ වදන් ඇසූ පේදුරු ලැබූ අත්දැකීම හා ඊට දැක්වූ ප්‍රතිචාරය ලියන්න. (ලකුණු 3)

(iii) මෙම කැඳවීම මගින් අපට ලද හැකි අත්දැකීම් මොනවාද? (ලකුණු 5)

6. උතුම් සමාජ මෙහෙවරක්

(i) කිතුනුවන්ට යහපත් සමාජ මෙහෙවරක යෙදීම සඳහා මඟ පෙන්වීම ලැබෙන්නේ කෙසේද? (ලකුණු 2)

(ii) ශුද්ධාත්මයාණන් තුළින් දිරිය ලබන අප තුළ පවත්වා ගත යුතු ගුණාංග කවරේ ද? (ලකුණු 3)

(iii) ශුද්ධාත්මයාණන්ගෙන් ආලෝකය ලබන අප එම ආලෝකය නිවස පාසල හා සමාජය තුළ පතුරුවන්නේ කෙසේද? (ලකුණු 5)